ආගමන සමය පළමු ඉරුදින

# දේව ප්‍රකාශන

01-12-13

## පළමුවන කියැවීම

ඉසයියස් 2:1-5

ඉසයියස් දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් උපුටා ගත් පාඨයෙකි.

**"සමිඳාණෝ ස්වකීය රාජ්‍යයේ සදාතන සාමය භුක්ති විඳීමට අප සැම කැඳවන සේක."**

ජුදා සහ ජෙරුසලම පිළිබඳ ව ආමොස්ගේ පුත් ඉසයියස්ට දෙවියන් වහන්සේ දුන් පණිවුඩය මෙසේ ය. මතු කාලයේ දී සමිඳුන්ගේ දෙව් මැඳුර පිහිටා ඇති කන්ද, උතුම් ලෙස ද සියලූ කඳුවලට ඉහළින් තිබෙන ලෙස ද පිහිටුවනු ලබන්නේ ය. සියලූ ජාතීහු එතැනට ගලා එන්නෝ ය. බොහෝ දෙනෙකු පැමිණ මෙසේ කියනු ඇත. එන්න, අපි යමු; සමිඳුන්ගේ කන්දට නගිමු; ඉශ්රායෙල් දෙවිඳුන්ගේ මැඳුරට පිවිසෙමු; එතුමාණන් පෙන්වන මාර්ගය ගැන ඉගෙන එහි ගමන් ගන්නට අපට හැකි වනු ඇත. මන්ද, සමිඳුන්ගේ පණිවුඩය පැමිණෙන්නේ සියොන් කන්දෙන් ය; එතුමාණන් සෙනඟට කතා කරන්නේ ජෙරුසලමෙන් ය. මහා ජාතීන් අතර භේද එතුමාණෝ නිරවුල් කරන සේක; එතුමාණෝ ජාතීන්ගේ කාරණා තීන්දු කරන සේක. තමන්ගේ කඩුවලින් නගුල් ද තමන්ගේ හෙල්ලවලින් දෑකැති ද ඔව්හු සාදාගන්නෝ ය. ජාතියක් ජාතියකට විරුද්ධ ව කඩු ගන්නේ නැත. ඔවුන් යුද්ධයට පුහුණු වන්නේ නැත. අහෝ! ජාකොබ්ගේ වංශය එන්න, සමිඳුන්ගේ ආලෝකයෙහි අපි ඇවිදිමු.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 122:1-2, 4-5. 6-9

පිළිතුර: "අපි සමිඳුන්ගේ මැඳුරට යමු"යි ඔවුන් කී විට මම ප්‍රීතියෙන් පිනා ගියෙමි.

ගීය: "දෙව් මැඳුරට යමු"යි ඔවුන් මට කී විට මම ප්‍රීතියෙන් පිනා ගියෙමි.
එම්බා ජෙරුසලම! අපේ දෙපා තිගේ වාසල ඇතුළේ තබා තිබේ.

ඉශ්රායෙල් සෙනඟට නියම කළ ලෙස ගෝත්‍රයෝ, සමිඳුන්ගේ ගෝත්‍රයෝ, එතුමන් නමට තුති දෙන පිණිස මෙම නගරය වෙත පැමිණෙති. මන්ද, සිංහාසනය, එනම්, දාවිත්ගේ සිංහාසනය සෙනඟ විනිශ්චය කරන පිණිස එහි පිහිටා තිබේ.

ජෙරුසලමේ සාමය උදෙසා අයැදුම් පුදන්න; තිට ප්‍රේම කරන්නෝ දියුණු වෙත් වා! තිගේ පවුරු තුළ සාමය බැබළේ වා! තිගේ මාලිගා තුළ සුරැකිතාව පවතී වා!

මාගේ නෑ මිතුරන් නිසා මම මෙසේ කියමි: "ජෙරුසලම තුළ සාමදානය වේ වා!" අපේ දෙව් සමිඳුන්ගේ මාලිගාව නිසා මම තිගේ යහපත සොයන්නෙමි.

## දෙවන කියැවීම

රෝම13:11-14

ශුද්ධ වූ පාවුලු තුමන් විසින් රෝමවරුන්ට ලියන ලද හසුනෙන් ගත් කොටසකි.

**"අපේ ගැළවීම ළං ළංව පැමිණේ."**

මේ සියල්ලෙහි දී, තීරණාත්මක කාලය පැමිණ ඇති බව සිතට ගන්න. මෙය නින්දෙන් පිබිද සිටිය යුතු වේලාව ය. මන්ද, අප ඇදහීමට පටන්ගත් කාලයට වඩා, අපේ ගැළවීම දැන් ළං වී ඇත. රැය බොහෝ දුරට ගෙවී ඇත. දිවා කාලය

ළඟ ය; එබැවින් අන්ධකාරයේ ක්‍රියා ඉවත ලා, ආලෝකයේ අවිආයුධ පැළඳගනිමු. අපේ කල්ක්‍රියාව දිවා කාලයට ඔබින සේ විය යුතු යි; අශෝභන උත්සවවලින් ද මධුපානෝත්සවයෙන් ද කාම තෘෂ්ණාවෙන් ද සල්ලාලකමින් ද අඬදබර හා ඊර්ෂ්‍යාවෙන් ද වැළකී සිටිමු. ස්වාමීන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ නමැති සන්නාහයෙන් සන්නද්ධ වන්න. මින් මතු පසිඳුරන් පිනවන පිණිස පාප ආශාවනට ඉඩ නොදෙන්න..

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## සාධුකාරය

ගීතාවලිය 85:7

ආලේලූයා! ආලේලූයා!
සමිඳුනි, ඔබේ තිර පෙම අපට පෙන්නුව මැනව.
ගැළවීමේ පිහිට අපට ද දානය කළ මැනව.
ආලේලූයා!

## ශුද්ධවූ සුවිශේෂය

මතෙව් 24:37-44

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**"ඔබත් අවදි ව සූදානම් ව සිටින්න."**

තවද නෝවාගේ දවස්වල සිදු වූ ලෙස ම මනුෂ්‍ය-පුත්‍රයාණන්ගේ පුනරාගමනය වන්නේ ය. එකල, ජල ගැල්මට ප්‍රථමයෙන්, නෝවා නැවට ඇතුළු වූ දිනය දක්වා, ඔව්හු කමින් බොමින්, ආවාහ විවාහ වෙමින් කල් යැවූ හ. ජල ගැල්ම පැමිණ සියල්ලන් ගසා ගෙන යන තුරු ඔව්හු කිසිවක් නොදත්හ; මනුෂ්‍ය-පුත්‍රයාණන්ගේ පුනරාගමනය ද එලෙස ම වනු ඇත. එකල මනුෂ්‍යයෝ දෙදෙනෙක් කෙතෙහි සිටිති; එක් තැනැත්තෙක් ගනු ලබන්නේ ය; අනික් තැනැත්තා හැරදමනු ලබන්නේ ය. ස්ත්‍රීහු දෙදෙනෙක් ඇඹරුම් ගලේ අඹරමින් සිටිති; එක් තැනැත්තියක් ගනු ලබන්නී ය; අනික් තැනැත්තිය හැරදමනු ලබන්නී ය. එබැවින් අවදි ව ඉන්න. ඔබගේ සමිඳාණන් වහන්සේ කිනම් දවසක එන සේක් ද යි ඔබ නොදන්නහු ය. සොරා කොයි යාමයේ එන්නේ ද යි ගෙදර ස්වාමියා දැන සිටියේ නම්, ඔහු නොනිදා සිට තමාගේ ගෙය බිඳීමට ඉඩ නොදෙන බව දැනගන්න. එබැවින් ඔබත් සූදානම් ව සිටින්න. කුමක් නිසා ද ඔබ බලාපොරොත්තු නොවන පැයක දී මනුෂ්‍ය-පුත්‍රයාණෝ වඩින සේක.

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.com/ වෙත පිවිසෙන්න.